Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## අධිකරණ සේවා කොමිෂන් සභාව

## සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා අයදුම්පත් කැඳවීම

01. අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේ සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

02. *වැටුප් පරිමාණය* :

අංක 03/2016 හා 2016.02.25 වැනි දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව වැටුප් පරිමාණය SL 1-2016 වේ. එනම් රු. 47,615-10x1335-8x1630-17x2170-රු.110,895/- වේ. ආරම්භක වැටුප් පියවර මෙම වැටුප් පරිමාණයෙහි 03 වන පියවර (රු. 50,285/-) වේ. රු. 58,295/- ඉක්මවීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. වයස අවුරුදු 45 සම්පූර්ණ කරන ලද නියමිත වැටුප් පියවරට එළඹි අයදුම්කරුවන් කාර්යක්ෂමතා කඩඉමෙන් නිදහස් කරනු ලැබේ. (2020.01.01 දක්වා රා.ප.ච. 03/2016 හි උපලේඛන II අනුව වැටුප් ගෙවනු ලැබේ.)

03. *වයස් සීමාව* :

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය. දැනටමත් රාජ්‍ය සේවයේ යෙදී සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

04. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* :

(අ) අවුරුදු 04කට නොඅඩු කාලයක් ක්‍රියාකාරී ලෙස වෘත්තියෙහි යෙදී සිටි නීතිඥවරයෙකු වීම

*හෝ*

(ආ) ශ්‍රී ලංකා අධිකරණ රෙජිස්ට්‍රාර් සේවයේ II පන්තියේ නිලධරයෙකු වීම

*හෝ*

(ඇ) රජයේ නෛතික අංශවල යටත් පිරිසෙයින් අවුරුදු 07ක සේවා පළපුරුද්දක් සහ සාමාන්‍ය ලිපිකාර සේවයේ පළමුවන පන්තියේ/රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ I ශ්‍රේණියේ අවුරුදු 05ක සේවා කාලයක් හිමි නිලධරයෙකු වීම හෝ රජයේ නෛතික අංශවල යටත් පිරිසෙයින් අවුරුදු 12ක සේවා පළපුරුද්දක් සහ සාමාන්‍ය ලිපිකාර සේවයේ II පන්තියේ 'අ' ඛණ්ඩයේ / රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ II ශ්‍රේණියේ අවුරුදු 10ක සේවා කාලයක් හිමි නිලධරයෙකු වීම.

*සටහන* - අධිකරණයන්හි ක්‍රියාපටිපාටිය, ගිණුම් කටයුතු, පරිපාලන කටයුතු හා විගණන කටයුතු පිළිබඳ පළපුරුද්දක් තිබීම විශේෂ සුදුසුකමක් ලෙස සැළකේ.

05. සෑම අයදුම්කරුවකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

06. සෑම අයදුම්කරුවෙක්ම,

(අ) විශිෂ්ට චරිතයකින් සහ මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(ආ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

07. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට නිලධාරීන් යටත් විය යුතු ය.

08. පහත සඳහන් ලිපි ලේඛන ඉල්ලා සිටිවිට ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන්ට හැකි විය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) උසස්ම අධ්‍යාපන සහතිකය
(ඇ) වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකය
(ඈ) සිංහලෙන්/දෙමළෙන්/ඉංග්‍රීසියෙන් සමත් වී ඇති උසස්ම විභාග පිළිබඳ සහතික හා
(ඉ) අධිකරණ ක්‍රියාපටිපාටිය, ගිණුම් කටයුතු, විගණන කටයුතු, පරිපාලන කටයුතු හා විමර්ශන සහ විනය කටයුතු පිළිබඳ පළපුරුද්ද සනාථ කෙරෙන සහතික (ඇත්නම් පමණි)

09. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම් පත්‍රය සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරා ගත යුතු ය.

10. නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2018.03.15 වැනි දින හෝ ඊට පෙර "ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, අළුත්කඩේ, කොළඹ 12" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් භාර දිය හැකි ය.

11. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

12. රජයේ/සංස්ථා සේවයේ නියුක්තව සිටින නිලධරයන්ගේ අයදුම්පත් තම දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය.

13. අයදුම්පත් හා ඊට අදාළ වෙනත් ලිපි ගණුදෙනු පිළිබඳව ඇමතිය යුත්තේ අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයා මිස, මෙම කාර්යාලයේ වෙනත් කිසිම නිලධාරියෙකු නොවේ.

14. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයෙහි පළකරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ පොදු කොන්දේසි කෙරෙහි ද අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

සංජීව සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2018 පෙබරවාරි මස 01 වැනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

## අධිකරණ සේවා කොමිෂන් සභාව

*සහකාර විමර්ශන නිලධාරි තනතුර සඳහා ආදර්ශ අයදුම්පත*

01. (i) සම්පූර්ණ නම (සිංහලෙන්) :————.
(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) ස්ථිර ලිපිනය :————.
(ii) කාර්යාලයීය ලිපිනය :————.

03. ජාතිය :————.

04. (i) උපන් දිනය :————.
(ii) වයස :————.

05. (i) ස්ත්‍රී/පුරුෂ භාවය :————.
(ii) විවාහක ද? අවිවාහක ද? වැන්දඹු ද? :————.
(iii) ස්වාමි පුරුෂයා/භාර්යාව, රජයේ/සංස්ථා හෝ පෞද්ගලික ආයතනයක සේවයේ නියුක්ත නම් ඒ පිළිබඳ විස්තර :————.

06. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් :————.
(දින සඳහන් කරමින්)

07. ගැසට් නිවේදනයේ 04 වන ඡේදයේ (අ), (ආ) හා (ඇ) හා එහි සටහන යටතේ අදාළ විස්තර සම්පූර්ණයෙන් :————.
(දින/කාල පරිච්ඡේද සඳහන් කරමින්)

08. (i) නීතිඥවරයෙකු නම් වෘත්තියට ඇතුළත් වූ දිනය :————.
(ii) ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි කාල පරිච්ඡේදය :————.
(දින/කාල පරිච්ඡේද සඳහන් කරමින්)

09. රජයේ/සංස්ථාවක සේවයේ යෙදී සිටී නම් සම්පූර්ණ සේවා විස්තර :————.
(දින/කාල පරිච්ඡේද සඳහන් කරමින්)

10. සමත් වී ඇති උසස්ම විභාගය
(i) සිංහලෙන් :————.
(ii) දෙමළෙන් :————.
(iii) ඉංග්‍රීසියෙන් :————.

11. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය ඃ
(ඒ අය ඔබ හොඳින් දන්නා වගකිවයුතු පුද්ගලයන් විය යුතුය)
(රජයේ/සංස්ථා සේවයේ යෙදී සිටින අයට මෙය අදාළ නොවේ)

(i) නම :————.
ලිපිනය :————.
රක්ෂාව :————.
ඔබව දැන සිටින කාල පරිච්ඡේදය :————.

(ii) නම :————.
ලිපිනය :————.
රක්ෂාව :————.
ඔබව දැන සිටින කාල පරිච්ඡේදය :————.

මෙම අයදුම්පතෙහි මවිසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියාගේ සහතිකය

.................................................................................................... නමැති නිලධාරියා/නිලධාරිනිය විසින් මෙහි 09 වන ඡේදයේ දක්වා ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදිය. උක්ත තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මුදාහැරිය හැක/නොහැක.

————,
දෙපාර්තමේන්තු/සංස්ථා ප්‍රධානියාගේ අත්සන.

දිනය :————.